# තිරසර සංවර්ධන අරමුණු පළාත් මට්ටමින් ළඟාකරගැනීම සඳහා වන මාර්ගෝපදේශය


**තිරසර සංවර්ධන සභාව**

නො:35, 02 වන මහල,
ලේක්හවුස් ගොඩනැගිල්ල,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

පටුන


1. හැඳින්වීම ........................................................................................................ 3

2. දැනුවත් කිරිම : තිරසර සංවර්ධන අරමුණු සඳහා වන 2030 න්‍යාය පත්‍රය............. 4 - 8

3. පළාත්සභා විෂයපථය සමාලෝචනය සහ සිතියම්ගත කිරීම .............................. 9 - 11

4. තිරසර සංවර්ධන අරමුණු සැලසුම්කරණට ප්‍රවාහගත කිරීමේ ක්‍රමවේදය ............. 11 - 17

4.1 ප්‍රමුඛතාකරණය

4.2 පාර්ශවකරුවන් හඳුනාගැනීම

4.3 ඉලක්ක සහ දර්ශක සකස් කිරීම සහ උපාය මාර්ග සිතියම් නැවත සැලසුම් කිරිම

4.4 තිරසර සංවර්ධන ඉලක්ක සැලසුම් ක්‍රියාවලියට ඒකාබද්ධ කිරිම

4.5 සැලසුම් සඳහා මූල්‍යකරණය/සම්පත් යෙදවීම

4.6 ප්‍රගතිය අධීක්ෂණය සහ වාර්තා කිරීම

4.7 සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම

5. වැඩිදුර තොරතුරු පරිශීලනය සඳහා භාවිත කළ හැකි සම්පත් ................................ 17

ඇමුණුම 1: පළාත්සභා සඳහා සුදුසු තිරසර සංවර්ධන දර්ශක සකස්කර ගැනීම ........................... 18 -21

## 1. හැඳින්වීම

2015 වසරේදී ලෝකයට එළිදක්වන ලද තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය දරන රටක් ලෙස සෙසු රටවල් 193 ක් සමඟ එක්ව අප රට ද එකඟතාව එළකරන ලදී.

සියලු පාර්ශවකරුවන්ගේ එකතුවෙන් සමස්ථ රාජ්‍යයේ (In the entire state) සමස්ථ සමාජයේ (Society as a whole) ප්‍රවේශයක් ලෙස ක්‍රියාවට නැංවිය යුතු මෙම සංවර්ධන න්‍යාය පත්‍රය මගින් රටක සෑම ප්‍රදේශයක් වෙතම සංවර්ධනය ළඟාකර ගැනීමට මඟ පෙන්වනු ලැබේ. මෙමගින් කිසිවකු මඟ නොහැරෙන පරිදි සංවර්ධන මානයන් විවෘත කරන, සියල්ල අන්තර්කරණය වූ වසර 2030 වන විට සමානාත්මතාවය සහ තිරසර ලෝකයක් නිර්මාණය කිරීමේ අවසාන අරමුණ ඇතිව, දරිද්‍රතාවය, අසමානතාවය, දේශගුණික විපර්යාස සහ පාරිසරික පරිහානිය ඇතුළුව ලෝකයේ වඩාත්ම දැවෙන අභියෝගවලට විසඳුම් සෙවීමට පුළුල් ප්‍රවේශයක් සපයයි.

ඒ අනුව, අරමුණු 17 ක් ඉලක්ක 169 ක් සහිතව ඉදිරිපත් කෙරුණු මෙම ගෝලීය න්‍යාය පත්‍රය මෙරට තුළ ක්‍රියාත්මක කිරීමේදී ජාතික මට්ටමින් මෙන්ම ප්‍රාදේශීය වශයෙන් පවතින ආයතන එයට අනුගතව සැලසුම් හා සංවර්ධන කාර්යයන් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තිරසර ලෙස සංවර්ධිත රටක් බවට පත්කිරීම සඳහා ජාතික මට්ටමේ අමාත්‍යාංශ, එම අමාත්‍යාංශ යටතේ පවතින ආයතනවල සැලසුම් තිරසර සංවර්ධන අරමුණු වලට ප්‍රවාහගත කරන ලද සැලසුම් වීම අවශ්‍ය වන අතර එවාට සමගාමීව පළාත් මට්ටමින් පවතින අමාත්‍යාංශ සහ ආයතන වල සැලසුම් ද අනුගත වීම වඩාත් යෝග්‍ය වේ.

තිරසර සංවර්ධනයට අදාල ජාතික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර බැඳීම් සාධනය කර ගැනීමට පහසුකම් සැපයිම සහ අදාළ සියලුම පාර්ශවකරුවන් සහ පළාත්සභා නවය විමසා ඒවායේ එකඟතාවය ඇතිව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය සකස් කිරිම 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර පනත අනුව පිහිටුවනු ලැබූ තිරසර සංවර්ධන සභාව වෙත පැවරී ඇත.

ඒ අනුව, තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගවලට අනුකූලව ක්‍රියාකිරිම සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම, පළාත්සභාවකම, පළාත් අමාත්‍යාංශයකම, පළාත් දෙපාර්තමේන්තුවකම හා පළාත් පාලන ආයතනයකම කාර්යභාරය විය යුතුය.

ඒ සඳහා, තිරසර සංවර්ධන අරමුණු කේන්ද්‍ර කරගත් පළාත් සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී සලකා බැලිය හැකි කරුණු ඇතුළත් මාර්ගෝපදේශයක් මෙමගින් සපයනු ලබයි. මූලික වශයෙන්, 2030 සංවර්ධන න්‍යාය පත්‍රය පිළිබඳ හැඳින්වීමක් සහ ජාතික වශයෙන් ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාල ඉලක්ක සහ පළාත් සුවිශේෂි තත්ත්වයන් පිළිබඳ සලකා පළාත් මට්ටමින් ඉලක්ක සකස් කරගනිමින් එම ඉලක්ක වෙත ළඟා වීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඒ සඳහා සුදුසු මූල්‍යකරණයන් යෙදවීම හරහා සැලසුම් ක්‍රියාත්මක කර නිශ්චිත කාල පරාසයන් තුළ එම ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සහ ඒ පිළිබඳ වාර්තාකරණය සිදු කිරීම යනාදී කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා මෙම මාර්ගෝපදේශය උපකාරී වනු ඇත. එමෙන්ම පරිශීලනය කළ හැකි සම්පත් පිළිබඳව ද මෙමගින් තොරතුරු සම්පාදනය කරයි.

## 2. දැනුවත් කිරීම : තිරසර සංවර්ධන අරමුණු සඳහා වන 2030 න්‍යාය පත්‍රය

පළාත් මට්ටමින් ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුවත් කිරීම, අවබෝධය ඇති කිරීම, ඉලක්ක සහ දර්ශක සමඟ ඔවුන්ව හුරු කරවීම සඳහා වැඩමුළු, පුහුණු සැසි සහ ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් සිදු කළ හැකිය.

ශ්‍රී ලංකාව ද ඇතුළුව එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් 193 ක් එක්ව තිරසර සංවර්ධන අරමුණු 17 ක්, ඒ සඳහා වන ඉලක්ක 169 ක් සහ එම ඉලක්ක ළඟා කර ගැනීම මැන බැලීම සඳහා දර්ශක 248 ක් සහිතව 2030 න්‍යාය පත්‍රය වසර 2015 දී එළිදැක්වන ලදී. එම අරමුණු පහත පරිදි වේ. ඉලක්ක හා දර්ශක ලැයිස්තුව වෙත මෙම දිගුව මඟින් ප්‍රවේශ විය හැකිය. https://unstats.un.org/sdgs/metadata/

ගෝලීය තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී රටක් ලෙස ශ්‍රී ලංකාවේ දායකත්වය ගෝලීය තිරසර සංවර්ධන දර්ශක රාමුවට අනුව සකස් කිරීමට සිදු වනු ඇත. ඒ අනුව එක් එක් පළාත සඳහා සකස්කර ගන්නා පළාත් තිරසර සංවර්ධන දර්ශක සමූහයක් නිර්මාණය කර ගැනීමේදී එය හැකිතාක් දුරට ගෝලීය දර්ශක රාමුව සමඟ අනුගත වන ලෙස දේශියකරණය කර ගත යුතු වේ. 2022 ජුලි 17 වන දින සිට භාවිතා කරණු ලබන ගෝලීය දර්ශක රාමුවට අන්‍යය දර්ශක 231 ක් ඇතුළත් වන අතර ඒවා පදනම් කරගනිමින් පළාත් සභාවලට අදාල වන දර්ශක රාමුවක් සකස් කර ගැනීම යෝග්‍ය වේ.


### 2030 න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක

| | |
|---|---|
|  | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව තුරන් කිරීම |
|  | සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම |
|  | නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම |
|  | පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම |
|  | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම |

| | |
|---|---|
| 6 CLEAN WATER AND SANITATION | සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම |
| 7 AFFORDABLE AND CLEAN ENERGY | සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, එලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම |
| 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම |
| 10 REDUCED INEQUALITIES | රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම |
| 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම |
| 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION | තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම |
| 13 CLIMATE ACTION | දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම |
| 14 LIFE BELOW WATER | තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායි භාවිතය |


| | |
|---|---|
| 15 LIFE ON LAND | භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය  කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම |
| 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS | තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම |
| 17 PARTNERSHIPS FOR THE GOALS | තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් සවිමත් කිරීම සහ පුනර්ජීවනය |

2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ලෝකයට ඉදිරිපත්වීමේ ක්‍රියාවලිය ඉතා දීර්ඝ ගමන් මඟක ප්‍රතිඵලයකි. වසර 1972 දී පැවති ස්ටොක්හෝම් සමුළුවේ සිට වරින් වර ලෝක නායකයින් එක්ව එළඹි එකඟතා මත පවත්වන ලද විවිධ සමුළු හා එහි ප්‍රතිඵල දළ වශයෙන් පහත සටහනේ දක්වා ඇත.




මෙම තිරසර සංවර්ධන අරමුණු 17 ප්‍රධාන කුළුණු 03 ක් මත පදනම් වී ඇත. එනම්, පාරිසරික (Environmental), ආර්ථික (Economic) හා සමාජයීය (Social) යන පරාසයන් එමඟින් ආවරණය කරයි. රටක හෝ කිසියම් ප්‍රදේශයක සිදු කරනු ලබන සංවර්ධනය පාරිසරික හිතකාමී, ආර්ථික ශක්‍යතාවයෙන් යුතු සහ සමාජීය පිළිගැනීමක් සහිත සංවර්ධනයක් විය යුතුය යන්න එහි අදහසයි. එවිට, පාරිසරික, ආර්ථික හා සමාජීය කරුණු ත්‍රිත්වය සමපාත වන තුලනාත්මක සංවර්ධනයක් ළඟාකර ගැනීමට හැකිවනු ඇත.

සංවර්ධන ක්රියාවලියේදී ආර්ථික ප්‍රතිලාභ හෝ සමාජීය ප්‍රතිලාභ හෝ පාරිසරික ප්‍රතිලාභ මත පමණක් පදනම්ව සංවර්ධන කටයුතු සිදු කිරීම හරහා තිරසරබව තහවුරු නොවන බව එහි අදහසයි. උපායමාර්ගිකව මෙම කුළුණු 03 සඳහාම ප්‍රතිඵලදායක වන පරිදි සංවර්ධන කටයුතු සිදු කිරීම මෙමගින් දිරිමත් කරයි.



තවදුරටත් මෙම තිරසර සංවර්ධන අරමුණු පොදු මානයන් 05 ක් (5Ps) ඔස්සේ බෙදා දැක්විය හැකිය. මිනිසා (People), පෘථිවිය (Planet), සාමය (Peace), සෞභාග්‍ය (Prosperity) හා හවුල්කාරිත්වය (Partnership) තහවුරු කිරීම සඳහා වැදගත් වන තිරසර සංවර්ධන අරමුණු එම මානයන් ඔස්සේ ගොනු ගත කර ඇත.




**1. මිනිසා:**

මිහිමත ජීවත්වන මිනිසුන්ගේ දුප්පත්කම, සාගින්න තුරන්කර ගෞරවයෙන්, සමානාත්මතාවයෙන් යුතුව ජීවත්වීම සහතික කිරීම.

2. **පෘථිවිය:**

තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය, ස්වාභාවික සම්පත් තිරසරව කළමනාකරණය කිරීම, දේශගුණික විපර්යාස පිළිබඳව හදිසි පියවර ගැනීම මගින් පෘථිවිය පිරිහීමෙන් ආරක්ෂා කිරීම.

**3. සාමය:**

භීතියෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී, යුක්ති සහගත දිවි පෙවෙතක් සහතික කිරීම.

**4. සෞභාග්‍ය:**

ආර්ථික, සමාජීය හා තාක්ෂණික ප්‍රගතියට අනුකූලව සෞභාග්‍යමත් හා තෘප්තිමත් ජීවන පැවැත්ම.

**5. හවුල්කාරිත්වය**

ශක්තිමත්, පුනර්ජීවනය වූ ගෝලීය සහයෝගීතාවයේ ස්වභාවය මත පදනම් වූ හවුල්කාරිත්වයක් ගොඩනැගීම.

මෙම තිරසර සංවර්ධන අරමුණු ප්‍රධාන මූලධර්ම කිහිපයක් මත පදනම් වේ. එනම් තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය, සහශ්‍ර සංවර්ධන ඉලක්ක (MDGs) වලින් වෙනස් වන්නේ පහත මූලධර්ම හේතුවෙනි.

- විශ්වීය බව (Universality)
- සමස්ථ ප්‍රවේශය (Inclusive)
- කිසිවකු මඟ නොහැරෙන සංවර්ධනය (Leave no one behind)
- පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය (Multi-stakeholder Partnerships)
- ඒකාබද්ධතාව (Integration)
- පරිවර්තනීය හැකියාව (Transformative)
- දේශීයකරණය කිරීමට ඇති හැකියාව (Localization)

තිරසර සංවර්ධන අරමුණු 17 එකිනෙක අතර අඩු වැඩි වශයෙන් බැඳී පවතින අතර එක් අරමුණක් වෙනුවෙන් කරනු ලබන කටයුතු සෙසු අරමුණු වලට ද බලපෑම් එල්ල කරයි.

එමෙන්ම, එක් ආයතනයක කාර්යභාරය මගින් අරමුණු කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට දායක විය හැකි අතර එක් අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතන කිහිපයක් එක්ව කටයුතු කළ යුතු අවස්ථා ද පවතී. උදාහරණයක් වශයෙන් ජලය සහ සනීපාරක්ෂාව සඳහා වන තිරසර සංවර්ධන අරමුණු අංක 06 හි ඉලක්ක 08 ක් පවතින අතර ඒ වෙනුවෙන් කටයුතු කරන ආයතන 43 ක් පවතී. එබැවින්, පළාත තුළ පවතින ආයතන හා ජාතික මට්ටමින් එක් එක් ක්ෂේත්‍ර සඳහා යෙදවුම් සපයනු ලබන පාර්ශවකරුවන් හඳුනාගෙන ඒකාබද්ධව කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

## 3. පළාත්සභා විෂයපථය සමාලෝචනය සහ තිරසර සංවර්ධන අරමුණු සිතියම්ගත කිරීම

තිරසර සංවර්ධන ඉලක්ක ඒකාබද්ධ කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා අදාළ පළාත් සභා විෂයන් පිළිබඳව සමාලෝචනය කිරීම සහ සිතියම්ගත කිරීම යෝග්‍ය වේ.

ඒ අනුව පළාත් රාජ්‍ය සේවා සැපයුම් ක්‍රියාවලිය තුළ සමගාමී සහ විමධ්‍යගත ලැයිස්තුවට අනුව පළාත් සභා විෂයන්, තිරසර සංවර්ධන අරමුණු වලට අනුකූලව පහත සඳහන් අයුරින් සිතියම් ගත කලහැකිය.

| පළාත් සභා විෂය | තිරසර සංවර්ධන අරමුණු |
|---|---|
| ▪ සමාජ සේවා සහ පුනරුත්තාපනය | 1 NO POVERTY |
| ▪ කෘෂිකර්මාන්තය, කෘෂිකාර්මික ව්‍යාප්තිය, පළාත් අවශ්‍යතා සහ කෘෂිකාර්මික සේවා ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය (අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් නිරවුල් කිරීමේ යෝජනා ක්‍රම, රජයේ ඉඩම් සහ වැවිලි කෘෂිකර්මාන්තය හැර) සුළු වාරිමාර්ග කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම, ජාතික කෘෂිකර්ම පර්යේෂණ ආයතන ලෙස නම් කර ඇති ආයතන හැර අනෙකුත් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන<br>▪ වාරිමාර්ග : වාරිමාර්ග කටයුතු සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම.<br>▪ පළාත තුළ ආහාර සැපයීම සහ බෙදා හැරීම<br>▪ සත්ව පාලනය<br>▪ ධීවර කර්මාන්තය | 2 ZERO HUNGER |
| ▪ ආරක්ෂණ සහ ළමාරක්ෂක සේවා<br>▪ අනාථ පුද්ගලයන් සහ පවුල් පුනරුත්ථාපනය කිරීම<br>▪ කායික, මානසික සහ සමාජීය වශයෙන් ආබාධිත පුද්ගලයන්ගේ පුනරුත්ථාපනය සහ සුබසාධනය<br>▪ මහජන රෝහල්, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස, මහජන සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, පවුල් සෞඛ්‍ය, මාතෘ හා ළමා රැකවරණය, ආහාර සහ ආහාර සනීපාරක්ෂාව, පාරිසරික සෞඛ්‍යය ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම<br>▪ දේශීය වෙදකම<br>▪ ආයුර්වේද බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, එවැනි බෙහෙත් ශාලා සහ රෝහල් සඳහා ප්‍රදානයන් සිදුකිරීම සහ ශාඛාගාර පිහිටුවීම සහ නඩත්තු කිරීම<br>▪ පළාත් පාලන සේවා | 3 GOOD HEALTH AND WELL-BEING |

| | |
|---|---|
| ▪ අධ්‍යාපන හා අධ්‍යාපනික සේවා<br>▪ පළාත් පාලන සේවා | 4 QUALITY EDUCATION |
| ▪ ළමා සහ කාන්තා කටයුතු සංවර්ධනය<br>▪ සමාජ සේවා සහ පුනරුත්ථාපනය<br>▪ ග්‍රාමීය සංවර්ධනය | 5 GENDER EQUALITY |
| ▪ වාරිමාර්ග - පළාත් එකකට වඩා වැඩි ප්‍රමාණයක් හරහා ගලා යන ගංගාවලට අදාළ වාරි යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර අනෙකුත් සියලුම වාරිමාර්ග කටයුතු සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම.<br>▪ පළාත් පාලන ආයතන මගින් සිදුකරන ජල සම්පාදන හා සනී පාරක්ෂාවට අදාල කටයුතු | 6 CLEAN WATER AND SANITATION |
| ▪ විද්‍යුත් බලශක්ති උත්පාදනය සහ ප්‍රවර්ධනය සඳහා වූ පළාත් වැඩබිම් (අඩවි) සහ ලබාදෙන පහසුකම් සංවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම (ජල-විදුලි බලය සහ ජාතික විදුලිබල පද්ධති පෝෂණය කිරීමට ලබාදෙන ජනනය බලය හැර) | 7 AFFORDABLE AND CLEAN ENERGY |
| ▪ ආර්ථික සැලසුම්කරණය<br>▪ පළාත තුළ මාර්ග මගී ප්‍රවාහන සේවා සහ මෝටර් රථ මගින් භාණ්ඩ ප්‍රවාහනය නියාමනය කිරීම සහ අන්තර් පළාත් මාර්ග ප්‍රවාහන සේවාවල විධිවිධාන සැකසීම<br>▪ පළාත් සංචාරක සංවර්ධනය<br>▪ සංස්ථාපිත නොවන වෙළඳාම, සාහිත්‍ය, විද්‍යාත්මක, ආගමික සහ වෙනත් සමාජ සහ සංගම් සඳහා නියාමනය කිරීම | 8 DECENT WORK AND ECONOMIC GROWTH |
| ▪ පළාත් මාර්ග, පාලම්, පාරු සේවා සහ අනෙකුත් යටිතල පහසුකම්<br>▪ පළාත තුළ පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කරන ලද ඕනෑම නීතියකින් හෝ ඊට යටත්ව අවසර දී ඇති ප්‍රමාණයට පතල් සහ ඛනිජ සංවර්ධනය නියාමනය කිරීම<br>▪ සමූපකාර, සමූපකාර ආයතන සහ පළාත තුළ සමූපකාර සමිති සංවිධානය කිරීම, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය සහ විගණනය | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE |
| ▪ ග්‍රාමීය සංවර්ධනය<br>▪ සමූපකාර, සමූපකාර ආයතන සහ පළාත තුළ සමූපකාර සමිති සංවිධානය කිරීම, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය සහ විගණනය | 10 REDUCED INEQUALITIES |
| ▪ පළාත් පාලන<br>▪ නිවාස හා ඉදිකිරීම්<br>▪ ක්‍රීඩාව දිරිගැන්වීම සහ සංවර්ධනය කිරීම<br>▪ සිනමාහල් සහ නාට්‍ය සංදර්ශන, සංගීතය, සිනමා ශාලා, විනෝදාස්වාදය | 11 SUSTAINABLE CITIES AND COMMUNITIES |
| ▪ සමූපකාර, සමූපකාර ආයතන සහ පළාත තුළ සමූපකාර සමිති සංවිධානය කිරීම, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය සහ විගණනය<br>▪ සමූපකාර අධ්‍යාපනය සහ ප්‍රචාරණය ඇතුළුව පළාත තුළ සමූපකාර සංවර්ධනය | 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION |
| ▪ පළාත තුළ පරිසරය ආරක්ෂා කිරීම<br>▪ ඉඩම්, එනම් ඉඩමෙහි හෝ ඊට වැඩි අයිතියක්, ඉඩම් අයිතිය පැවරීම සහ ඉඩම් අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම. | 13 CLIMATE ACTION |

| | |
|---|---|
| ▪ මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී සංවර්ධන කටයුතු | 14 LIFE BELOW WATER |
| ▪ ඉඩම්, එනම් ඉඩමෙහි හෝ ඊට වැඩි අයිතියක්, ඉඩම් අයිතිය පැවරීම සහ ඉඩම් අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම | 15 LIFE ON LAND |
| ▪ මහජන සාමය | 16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS |
| ▪ ආර්ථික හා සමාජීය අංශයේ සංවර්ධනය සඳහා දේශීය හවුල්කාරිත්වය | 17 PARTNERSHIPS FOR THE GOALS |

## 4. තිරසර සංවර්ධන අරමුණු සැලසුම්කරණට ප්‍රවාහගත කිරීමේ ක්‍රමවේදය

### 4.1. ප්‍රමුඛතාකරණය

පළාත් රාජ්‍ය අංශයතුල දැනට පවතින සම්පත්, අවස්ථා, දුර්වල සහ සෘණාත්මක තත්වයන් අවබෝධ කරගනිමින් තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතා හඳුනා ගැනීම යෝග්‍ය වේ. මෙහිදී පළාතේ විශේෂිත සමාජ-ආර්ථික, පාරිසරික සහ සංස්කෘතික සහ ජාතික මට්ටමේ සාධක, චක්‍රලේඛ මාර්ගෝපදේශ පිළිබඳව සලකා බලන අතර යාවත්කාලීන සංඛ්‍යාලේඛණ පිළිබඳව සලකා බැලීම ද වැදගත් වේ.

තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ ජාතික මට්ටමේ දත්ත වේදිකාවක් මේ වන විට තිරසර සංවර්ධන සභාව විසින් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා රාජ්‍ය ආයතන 80 ට අධික ප්‍රමාණයක් සම්බන්ධ වී සිටී. (https://data.sdg.lk/) මෙයට අමතරව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සමීක්ෂණ දත්ත පළාත් මට්ටමින් ලබා ගෙන එක් එක් පළාත තුළ එක් එක් ක්ෂේත්‍ර වල පවතින ප්‍රගතින් හා දුර්වලතා විශ්ලේෂණය කර හඳුනා ගැනීම අවශ්‍ය වේ.

නිශ්චිත හා ප්‍රමුඛ ක්ෂේත්‍ර හඳුනාගැනීම උදෙසා අවශ්‍යතා හඳුනා ගැනීමක් (Need Assessment) සිදුකල යුතුය. මෙම ක්‍රියාවලියේදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ,

- ❖ පළාතේ සුවිශේෂී සාධක
- ❖ නිකුත්කර තිබෙන චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ
- ❖ යාවත්කාලීන දත්ත රැස්කරගැනීමට ඇති හැකියාව
- ❖ උපරිම දත්ත දිගුවක් බාධාවකින් තොරව සහ සංගතව ලබාගැනීමට ඇති හැකියාව (වේගවත් ස්වයං තක්සේරුවක් සඳහා දත්ත ලබා ගත යුත්තේ සමීක්ෂණ, සංගණන, පරිපාලන වාර්තා, භූගෝලීය රූප හෝ වෙනත් ආකාරයේ විවෘත දත්ත ඇතුළු දැනට පවතින ජාතික හා අන්තර්ජාතික නිල සංඛ්‍යාලේඛණ වලින් පමණි.)

වඩාත් වැදගත් වන්නේ භාවිතයට ගත හැකි විවිධ දත්ත මූලාශ්‍ර හඳුනා ගැනීම හා එම දත්ත ගොනු කර ගැනීම සඳහා දත්ත වේදිකාවක් (Data Platform) නිර්මාණය කර ගැනීමයි. එවැනි දත්ත වේදිකාවක යාවත්කාලීන දත්ත ඇතුළත් කිරීම අඛණ්ඩව සිදු කිරීම අවශ්‍ය වන අතර පවතින දත්ත විශ්ලේෂණය කර ගුණාත්මක (Qualitative) හා ප්‍රමාණාත්මක (Quantitative) විග්‍රහයන් සිදු කර අවකාශීය (Spatial) හා අවකාශීය නොවන

(Non-Spatial) ලෙස ප්‍රතිඵල ජනනය කිරීම මගින් පළාත තුළ කුමන ක්ෂේත්‍ර, කවර ප්‍රදේශ, කොපමණ මට්ටමකින්, කුමන කාල වකවානු වලදී, කෙබඳු ආකාරයකට, කිසිවකු මග නොහැරෙන පරිදි තිරසර ලෙස සංවර්ධනය කළ යුතු ද යන්න උපායමාර්ගිකව පාර්ශවකරුවන් සමඟ හඳුනාගැනීම වඩාත් සුදුසු ක්‍රමවේද වේ.

තිරසර සංවර්ධන අරමුණු එකිනෙකට ඒකාබද්ධව සහ එකිනෙකට සමගාමීව පවතී. එක් අරමුණක් ලඟාකර ගන්නාවිට ඒ හා සම්බන්ධ සහ එහි බලපෑමට නතුවන අනෙකුත් අරමුණු ද සාක්ෂාත් විය හැක. එසේම එම අරමුණු සියල්ලෙහි ප්‍රතිලාභ හිමිකරගැනීමට ද හැකියාව පවතී. එසේම තෝරාගන්නා ක්ෂේත්‍රයෙහි ශීඝ්‍ර ප්‍රගතියක් ඇති කිරීම සඳහා වඩාත්ම පසුගාමී ප්‍රදේශ හඳුනා ගැනීම සහ එම ක්ෂේත්‍රවල පවතින සම්පත්, ලැබී ඇති දැනුවත් කිරීම් සහ ගෙනඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ පුලුල් දැනුවත්බවක් ලබාගැනීම අත්‍යවශ්‍ය වේ.

නිදසුනක් ලෙස, යාවත්කාලින දත්ත අනුව සෙසු පළාත් වලට සාපේක්ෂව තම පළාත තුළ දරිද්‍රතා අනුපාතය 60% පමණ වන විට, විරැකියා ප්‍රතිශතය 5% වන විට , පානීය ජල සැපයුම් ආවරණ ප්‍රදේශවල ප්‍රතිශතය 25% ක් පමණ වන විට , නිෂ්පාදන ආර්ථිකයට දක්වන දායකත්වය 10% ක් පමණ වන විට එම ක්ෂේත්‍ර පිළිබඳ වැඩි අවධානයක් යොමු කර විවිධ පැතිකඩ ඔස්සේ ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්ගේ තුළිත බවක් ඇති වන පරිදි ප්‍රමුඛතා හඳුනා ගැනීම අවශ්‍ය වේ.

## 4.2. පාර්ශවකරුවන් හඳුනාගැනීම

පළාත තුළ සිදු කරනු ලබන සංවර්ධන ක්‍රියාවලියේ දී විවිධ ක්ෂේත්‍ර සඳහා එක් එක් පාර්ශවකරුවන්ගේ දායකත්වය හා සහභාගීත්වය ලබා ගැනීම සංවර්ධන කාර්යයන් පහසු කරනු ලබයි. එබැවින්, පළාත තුළ පවතින රාජ්‍ය ආයතන, සිවිල් සමාජ සංවිධාන, ආධාර හා ප්‍රදානයන් සපයන ආයතන, පෞද්ගලික අංශය, එක් එක් ක්ෂේත්‍රවල ප්‍රවීණයන් සහ ප්‍රජාවන් ඇතුළත් පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය සිතියම්ගත කිරීම (Stakeholder Mapping) වැදගත් වේ. වඩා වැදගත් වන්නේ පළාත් මට්ටමින් තිරසර සංවර්ධන අරමුණු ප්‍රවාහගත කිරීම, දත්ත ගොනු කිරීම, සැලසුම් සකස් කිරීම, සම්පත් යෙදවීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම යන සෑම අදියරකදීම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ලබා ගැනීමයි.

මෙවැනි බහුපාර්ශවිය ක්‍රියාවලියක් සඳහා පහත පරිදි විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය අවශ්‍ය වේ.


| අංශය | ආයතන |
|---|---|
| මධ්‍යම රජය සහ ඒ යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශිය පරිපාලන ආයතන | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, අමාත්‍යාංශ, මුදල් කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| පළාත්සභාව සහ අදාල ආයතන | පළාත් අමාත්‍යාංශ, පළාත් පාලන ආයතන, පළාත් දෙපාර්තමේන්තු, අධිකාරි, කාර්යාංශ, පළාත් පාලන ආයතන වැනි අදාලවන සියලු ආයතන |
| සිවිල් සමාජ සංවිධාන | රාජ්‍ය නොවන සංවිධාන, ස්වේච්ඡා සංවිධාන, ආදිවාසී ජනතාවගේ සංවිධාන, ඇඳහිලි මත පදනම් වූ සංවිධාන, සමාජ ව්‍යාපාර සහ ප්‍රජා මූලික සංවිධාන, ආන්තික ප්‍රජාව නියෝජනය කරන සංවිධාන |
| ව්‍යාපාරික ප්‍රජාව | ව්‍යාපාරික නායකයින්, වාණිජ හා කර්මාන්ත මණ්ඩල, සමුපකාර සහ වෘත්තීය සමිති, ආර්ථික සංවර්ධන ආයතන සහ නිෂ්පාදකයින් |
| අධ්‍යාපන ආයතන | විශ්ව විද්‍යාල, තාක්ෂණික ආයතන, පර්යේෂණ මධ්‍යස්ථාන, ජාතික සහ පළාත් අධ්‍යාපන ආයතන |
| සංවර්ධන හවුල්කරුවන් | ද්විපාර්ශවික සහ බහුපාර්ශවික පරිත්‍යාගශීලීන්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන, කලාපීය සංවර්ධන සහ මහ බැංකු, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන. |

පාර්ශවකරුවන්ගේ සහභාගීත්ව වර්ණාවලිය (Partnership Spectrum) අනුව සන්ධර්භ තුනක් යටතේ ඔවුනගේ සහභාගීත්වය ලබා ගත හැකිය. එනම්,

i. පවතින සම්පත් පාර්ශවකරුවන් අතර හුවමාරු කර ගනිමින් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම .

ii. විවිධ පාර්ශවකරුවන් එකට එක්ව එක් අරමුණක් වටා සම්පත් ගොනු කර සම්ප්‍රදායික සංවර්ධන ක්‍රියාවලිය වඩා ඵලදායීව හා කාර්යක්‍ෂමව සිදු කිරීම.

iii. බහුවිධ පාර්ශවකරුවන් එකට එක්ව කටයුතු කිරීම හරහා එක් එක් පාර්ශව තනිව කටයුතු කිරීමෙන් ළඟා කර ගත නොහැකි පරිවර්තනිය වෙනසක් සඳහා සම්පත් යෙදවීම.

<table>
<tr><th>පවතින සම්පත් පාර්ශවකරුවන් අතර හුවමාරු කර ගැනීම</th><th>1 සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රියාවලිය වඩා හොඳින් සිදු කිරීම</th><th>2 පරිවර්තනීය සංවර්ධනය</th></tr>
<tr><td colspan="3">
</td></tr>
<tr><td>පාර්ශවකරුවන් විසින් සෑම පාර්ශවකරුවකුටම ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් ඔවුන් සතුව පවතින සියලු වර්ගවල සම්පත් හුවමාරු කර ගනී. ඒ තුළින් ඔවුන්ට වැඩි සම්පත් ප්‍රමාණයක් ලබා දීමට හෝ වඩා හොඳ බෙදා හැරීමක් සිදු කිරීමට හැකියාව උද වේ.<br><br>උදා:- රාජ්‍ය නොවන සංවිධානයක් වැඩසටහනක් සඳහා සමාගමකින් අරමුදල් ලබා ගැනීම සිදු වූ විට සමාගම කීර්තියක් අත්පත්කර ගනී. රාජ්‍ය නොවන සංවිධාන අතර තාක්ෂණික පළපුරුද්ද හුවමාරු කර ගැනීම වැනි සම්පත් හුවමාරු වීම් තුළින් වඩා හොඳ වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා දැනුම ගොඩනැගීම.</td><td>සාම්ප්‍රදායික සංවර්ධන ක්‍රියාවලියෙහි බලපෑම සෘජුව හෝ වක්‍රව වඩාත් ඵලදායීව, කාර්යක්ෂමව හා නව්‍ය ලෙස හෝ විශාල පරිමාණයෙන් ලබා දෙන බහුවිධ පාර්ශවකරුවන් ඔවුන්ගේ අනුපූරක හෝ සමාන සම්පත් ඒකාබද්ධ කිරීම තුළින් පාර්ශවකරුවනට ඔවුන්ගේ කොටස්වල එකතුවට වඩා වැඩි යමක් ලබා දීමට හැකි වේ.<br><br>උදා:- විවිධ සංවිධාන උපදේශන ව්‍යාපාරයක් වටා එකතු වී, වෙනසක් ලබා දීමට ප්‍රමාණවත් විවේචනාත්මක ස්කන්ධයක් නිර්මාණය කිරීම.</td><td>බහුවිධ පාර්ශවකරුවන් විසින් අත්‍යාවශ්‍ය අනුපූරක සම්පත් එකට එක් කර එමගින් පද්ධති පරිවර්තනයක් ලබා දීමට අවශ්‍ය මෙවලම් නිර්මාණය කරන අතර, එය එක් එක් පාර්ශව තනිව කටයුතු කිරීමෙන් අත් කරගත නොහැකි වේ.<br><br>උදා:- සැපයුම්කරුවන්, ගොවින් සහ ප්‍රධාන ගැනුම්කරුවන් ආහාර දාමයක් ලෙස එකට එකතු කර, ජෛව-ශක්තිමත්, වඩා පෝෂ්‍යදායි භෝග භාවිතා කිරීම සඳහා පරිණාමනය කිරීම තුළින් සෞඛ්‍ය වැඩි දියුණු කිරීම.</td></tr>
</table>

(මූලාශ්‍රය : SDG Partnership Strategy , 2023)

උදා-:

තිරසර සංවර්ධන අරමුණු අංක 04 : සැමට ගුණාත්මක අධ්‍යාපනය

යම් පළාතක ද්විතියික අධ්‍යාපනය නිම කරන වයස අවුරුදු 16 - 17 අතර ළමුන්ගෙන් ප්‍රතිශතය 25% - 30% ක් පමණ වන අවස්ථාවක, එනම් එම පළාතේ ළමා ජනගහනයෙන් 3/4 ක් ද්විතියික අධ්‍යාපනය නොලබන බව පෙනී යයි. එහෙත්, තිරසර සංවර්ධන අරමුණු අංක 04 අනුව 2030 වන විට 100% ක ගුණාත්මක අධ්‍යාපන මට්ටමට ළඟාවීම සඳහා පෙළඹීමක් තිබිය යුතුය.

එවැනි අවස්ථාවක මේ සඳහා පාර්ශ්වකරුවන් වන රජය, ව්‍යාපාරික ප්‍රජාව, විද්වතුන් සහ සිවිල් සමාජය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින මෙම පරතරය පිළිබඳ අවධානය යොමු කර පාර්ශවකරුවන්ගේ අදහස් හා යෙදවුම් භාවිත කර මෙම තත්ත්වය අවම කිරීම සඳහා උපායමාර්ගික සැලස්මක් සකස් කිරීම යෝග්‍ය වේ.

පවතින පරතරය අවම කිරීම සඳහා, අඩු ආදායම්ලාභී සිසුන් සඳහා වැඩි ප්‍රවේශයක් සැපයීම, ගුණාත්මක පුහුණු ගුරුවරුන් ප්‍රමාණය වැඩි කිරීම සහ පාසල් වල පවතින පහසුකම් ඉහළ නැංවීම, දුරස්ථ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීම, මාර්ගගත නව්‍ය තාක්‍ෂණිකක්‍රම යොදා ගැනීම හරහා විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ද ඉගෙනුම් ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීම යනාදිය සඳහා තාක්‍ෂණික හා මූල්‍ය සම්පත් ලබාගතහැකි පාර්ශවකරුවන්ගේ සිතියමක් සකස් කිරීම වඩා සුදුසු ක්‍රමවේදය වේ.

## 4.3.ඉලක්ක සහ දර්ශක සකස් කිරීම සහ උපාය මාර්ග සිතියම් නැවත සැලසුම් කිරීම

හඳුනාගත් ප්‍රමුඛතා පාදක කර ගනිමින් ගෝලීය ඉලක්ක හා දර්ශක පළාතට ගැලපෙන අයුරින් සකස් කර ගැනීම සිදු කළයුතු අතර මේ සඳහා පළාත් සැලසුම්වල පවතින ඉලක්ක සහ දර්ශක සමාලෝචනය කිරීම සහ දැනට ජාතික මට්ටමින් සකස් කර ඇති ඉලක්ක ලැයිස්තුව පරිශීලනකර අවශ්‍ය සංශෝධනය කර නිශ්චිත ඉලක්ක හඳුනා ගැනීම සහ පළාත් මට්ටමින් තිරසර සංවර්ධන අරමුණු වෙත ප්‍රගතිය මැනිය හැකි දර්ශක සංවර්ධනය කිරිම යෝග්‍යවේ. මේ වන විට ජාතික මට්ටමින් සකස් කර ඇති ඉලක්ක ලැයිස්තුව සහ දත්ත ලබාගැනීම සඳහා මෙම දිගුව හරහා ප්‍රවේශ විය හැකිය.(https://sdc.gov.lk/sites/default/files/2023-06/Status%20Update%20of%20SDG%20Indicators_June%202023.pdf)

සකස්කරනු ලබන ඉලක්ක, සුවිශේෂී (Specific), මැනිය හැකි (Measurable), සාක්ෂාත් කරගත හැකි (Achievable), අදාළ (Relevant), නිෂ්චිත කාලරාමුවක් තුළ සපුරාගත හැකි (Time-Bound) ඉලක්ක විය යුතු අතර එම ඉලක්ක පිළිබඳව සියලු දෙනාගේ දැනුවත්භාවය ද අවශ්‍ය වේ. එක් එක් තිරසර සංවර්ධන අරමුණට අදාලව ජාතික මට්ටමින් තිරසර දර්ශක පෙළගැස්විය හැකි ආකාරය ඇමුණුම 1 වගුව මගින් දක්වා ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා පළාත් රාජ්‍ය සේවා සැපයීමට අදාළව පවතින ප්‍රතිපත්ති, උපාය මාර්ග, ව්‍යාපෘති සහ වැඩසටහන් නැවත සැලසුම්කර ඇගයීම් කටයුතු සිදුකල යුතුය. එහිදී පහත මෙවලම භාවිතා කල හැකිය.

- ❖ දිගුකාලීන පරිවර්තනයක් සඳහා දිගුකාලීන සැලසුම් ක්‍රියාවලියක් අවශ්‍ය වේ.
- ❖ අතීත අත්දැකිම් විග්‍රහය (Back casting), විශිෂ්ට අත්දැකිම් හුවමාරුවමත පදනම්ව බලාපොරොත්තුවන අනාගත අපේක්ෂාවන් සාක්ෂාත් කර ගත හැකි අයුරින් උපාය මාර්ග සැලසුම් කිරීම සඳහා වර්තමානයේ සිට අනාගතය දෙස මෙන්ම ආපස්සට විග්‍රහාත්මකව සලකා බැලීම ද අවශ්‍ය වේ.
- ❖ මෙහිදි, දිගු කාලීන සහ ප්‍රමාණාත්මක තිරසර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අතරමැදි ක්‍රියාවන් සමඟ සංවර්ධන ප්‍රගතිය අත්විය යුත්තේ කෙසේදැයි සිතිම සඳහා ගැටළු විසඳීමේ රාමුවක් ගොඩනගා ගැනීම යෝග්‍ය වේ. එය අපේක්ෂිත ප්‍රතිඵලයේ පුරෝකතනයෙන් ආරම්භ වන අතර ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය දේ (මානව, මූල්‍ය, නෛතික වැනි සාධක) අවබෝධකර ගැනීමට පසුවිපරමක් සිදුකල යුතුය.

## 4.4. තිරසර සංවර්ධන ඉලක්ක සැලසුම් හා සංවර්ධන ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම

පළාතේ හඳුනාගත් ප්‍රමුඛ ක්ෂේත්‍ර සඳහා සැලසුම් සකස් කිරීමේදී පළාත් සැලසුම්, තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සහ දර්ශක සමඟ සලකා බලන බවට සහතික විය යුතුය.

උපායමාර්ගික සැලසුම්කරණය, අයවැයකරණය, සහ අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලීන් වෙත තිරසර සංවර්ධන ඉලක්ක සහ දර්ශක ඇතුළත් කිරීමෙන් මෙය කළ හැකිය. උදාහරණයක් වශයෙන් හඳුනාගත් ඉලක්ක ළඟාකර ගැනීම සඳහා පළාතේ පස් අවුරුදු සැලැස්මට එම ඉලක්ක ගොනු කිරීම, එම පස් අවුරුදු සැලැස්ම අනුව වාර්ෂික සැලසුම්/ ආයතනික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම අවශ්‍ය වේ. (මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන මාර්ගෝපදේශ / චක්‍රලේඛ / ආකෘති වලට අනුකූලව සිදුකලයුතු වේ). මෙහිදී ඉතා වැදගත් වනුයේ නිශ්චිත කාල රාමුවක් තුළ එම ඉලක්ක කොපමණ මට්ටමකින් ළඟාකර ගෙන තිබෙනවාද යන්න මැණිය හැකි තිරසර දර්ශක හඳුනාගෙන තිබීමයි.

## 4.5. සැලසුම් සඳහා මූල්‍යකරණය/සම්පත් යෙදවීම

සැලසුම් තුළ හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍යතා තක්සේරුව පදනම් කරගනිමින් මූල්‍ය උපාය මාර්ගයක් සකස් කිරීම අවශ්‍ය වේ. මෙහිදී පළාත්සභා සතු ඉපයීම් හා මධ්‍යම රජයේ මූල්‍ය ප්‍රතිපාදන හැරුණු කොට වෙනත් මූලාශ්‍ර හඳුනා ගැනීම වඩා සුදුසු ක්‍රමවේදය වේ.


එනම්, දේශීය හා විදේශීය සංවර්ධන අරමුදල් සපයන ආයතන, පෞද්ගලික අංශයේ සමාජ වගකීම් හා පරිසර හිතකාමී වැඩසටහන් (Corporate Social Responsibility and ESG)සඳහා වෙන් කර ඇති අරමුදල් මූලාශ්‍ර හඳුනාගෙන ප්‍රදේශයේ වැඩි අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍ර කෙරෙහි පළාත් සැලසුම් තුළින් මූල්‍යකරණය සිදු කිරීම වඩා ඵලදායි වේ. එමඟින්, සම්පත් නාස්තිය අවම වීම, අවධානය යොමු නොවී ඇති ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රතිපාදන යෙදවීමට හැකිවීම හා සම්පත් අවභාවිත වීම මෙමගින් වළක්වා ගත හැකි වේ.

තවද, සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය සම්පත් පමණක් නොව තාක්ෂණික සම්පත් හා මානව සම්පත් ද වෙනත් පාර්ශවකරුවන්ගෙන් සපයා ගැනීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය වේ.

මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සඳහා 2019 වර්ෂයේ අයවැය වෙන් කිරීම තිරසර සංවර්ධන අරමුණු අනුව පහත පරිදි පෙළගැස්විය හැකිය.

| තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ විෂය ක්ෂේත්‍ර | රු. මිලියන |
|---|---|
| ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | - |
| දේශගුණික විපර්යාස | - |
| සාමකාමී, යුක්ති සහගත සහ ශක්තිමත් ආයතන | - |
| ගෝලීය සහයෝගීතාව | - |
| කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් | 5352 |
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 4117 |
| අසමානතා අවම කිරීම | 3030 |
| පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව | 1404 |
| සාගින්න තුරන් කිරීම | 1226 |
| තිරසර නගර සහ ජනාවාස | 1157 |
| යහපත් රැකියා ප්‍රවර්ධනය සහ තිරසර ආර්ථික වර්ධනය | 1078 |
| වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය | 862 |
| භූගෝලීය පරිසර පද්ධති සහ ජෛව විවිධත්වය ( මිහිමත ජීවිතය ) | 762 |
| දුගී බව තුරන් කිරීම | 323 |
| සාගර මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය (ජලජ ජීවය) | 214 |
| දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය | 198 |

(මූලාශ්‍රය : Voluntary Sub-national Review, 2022)



(මූලාශ්‍රය : Voluntary Sub-national Review, 2022)

## 4.6. ප්‍රගතිය අධීක්ෂණය සහ වාර්තා කිරීම

විධිමත් ක්‍රමවේදය අනුව සකස් කරගත් සැලැස්ම ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය මැන බැලීමේදී ඉලක්කගත ක්‍රියාකාරකම් වලට අදාළව මූල්‍ය ප්‍රගතිය වාර්තාකරණයට අමතරව ප්‍රතිඵල (Result) හා බලපෑම් (Impact) අධීක්ෂණය සඳහා ද ක්‍රමවේදයක් සකස් කිරීම මගින් තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි දක්වන දායකත්වය වාර්තා කිරීම පහසු වේ.

තවද, එක් එක් තිරසර සංවර්ධන අරමුණ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණයන් හඳුනා ගැනීම සඳහා SDG Budget Tagging & Coding ක්‍රමවේදය හරහා ගොනු කර ගත හැකි දත්ත භාවිතකර විශ්ලේෂණ සිදු කළ හැකිය. ඒ අනුව කුමන අරමුණු සඳහා අඩු වැය කිරීම් සිදු කර ඇත්ද යන්න සහ ඌන වැය කිරීම් ද හඳුනා ගෙන ඉදිරි වර්ෂ වල සැලසුම් සකස් කිරීමේ දී ආවරණය නොවුණු ක්ෂේත්‍ර වලට ප්‍රතිපාදන යෙදවීමට හැකි වීමෙන් තිරසර සංවර්ධනය සඳහා වන ප්‍රවේශය ගුණාත්මකව සිදුකල හැකිය.

තිරසර සංවර්ධන ඉලක්කයන්හි ප්‍රගතිය මැනීම සඳහා දත්ත රැස් කිරීම ප්‍රධාන ක්‍රියාවලි තුනක් මත රඳාපවතී.

- අධීක්ෂණ සඳහා භාවිතා කලහැකි ශක්තිමත් පළාත් තිරසර සංවර්ධන දර්ශක සමූහයක් නිර්මාණය කිරීම
- සංඛ්‍යානමය ධාරිතාව ශක්තිමත් කිරීම හා දත්ත යාවත්කාලීන කිරීම
- දත්ත සම්පාදනය සඳහා නූතන තාක්ෂණය සහ නව දත්ත මූලාශ්‍ර උපයෝගී කර ගැනීම

යොදාගන්නා දර්ශක අඛණ්ඩ අධීක්ෂණය සඳහා යෝග්‍ය, ප්‍රතිඵල කේන්ද්‍ර කරගත්, විද්‍යාත්මක පදනමකින් ඉදිරි දැක්මක් සහිතව ශක්තිමත් දත්ත පදනමක් මත ගොඩනගනු ලැබූ දර්ශක විය යුතුය. එමෙන්ම, එම දත්ත විවිධ පැතිකඩ නිරූපනය කරනු ලබන දත්ත කාණ්ඩයන්ගෙන් සමන්විත (වයස් කාණ්ඩ, ස්ත්‍රීපුරුෂභාවය, ආදායම් තත්ත්වය, ආගමික විවිධත්වය, වාර්ගික විවිධත්වය, භූගෝලීය හා ප්‍රාදේශීය වෙනස්කම්, ආන්තික සමාජ කණ්ඩායම්) යනාදිය නිරූපණය වන අයුරින් දත්ත මූලාශ්‍ර මත ගොඩනගා ගත යුතුවේ. එමෙන්ම සීමාකාරී සාධක සහ සංකීර්ණ තත්ත්වයන් සඳහා වෙනත් අදාල දර්ශක හඳුනාගත හැකිය.

### 4.7. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිළිබඳව ඇගයීම

තිරසර සංවර්ධන ඉලක්ක පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය අවබෝධකර ගැනීමට සහ සංවර්ධන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඇගයීම අවශ්‍ය වේ. තිරසර සංවර්ධන අරමුණුවල අදාලත්වය සහ සැලසුම් සහ සංවර්ධන ක්‍රියාවලියේ ඵලදායිතාව, කාර්යක්ෂමතාව, සඵලතාවය, බලපෑම සහ තිරසාර බව තීරණය කිරීමට ඇගයීම උපකාරී වේ.

## 5. වැඩිදුර තොරතුරු පරිශීලනය සඳහා භාවිත කළහැකි සම්පත්

ජාතික ප්‍රතිපත්තින්ට හා පළාත් ප්‍රමුඛතාවයන්ට අනුගතව තිරසර සංවර්ධන අරමුණු සලකා බලමින් දිගුකාලින, මධ්‍ය කාලින සහ කෙටි කාලින පළාත් සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලියේ දී මෙන්ම සෙසු සංවර්ධන කාර්යයන් වලදී භාවිතයට ගතහැකි, තිරසර සංවර්ධන අරමුණුවලට අදාළවන පරිදි සකස්කර තිබෙන පහත සම්පත් වෙත ප්‍රවේශවීම මගින් ද වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

I. SDC Website (www.sdc.gov.lk)
තිරසර සංවර්ධන සභාව පවත්වාගෙන යනු ලබන මෙම වෙබ් අඩවියෙහි ජාතික මට්ටමින් සිදු කරනු ලබන කටයුතු සම්බන්ධයෙන් සහ වරින් වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ පිළිබඳ මෙන්ම පරිශීලනය සඳහා වැදගත් වන පොත් පත් ද ඇතුළත් කර ඇත.

II. SDG Data Portal (https://data.sdg.lk/)
තිරසර සංවර්ධන සභාව විසින් පවත්වාගෙන යනු ලබන ජාතික දත්ත වේදිකාවෙහි මේ වන විට දර්ශක සියයකට අධික ප්‍රමාණයක් සඳහා දත්ත ඇතුළත් කර ඇති අතර එය වරින්වර යාවත්කාලින කරනු ලබයි.

III. National SDG Progress Dashboard (https://data.unescap.org/data-analysis/country-sdg-profiles)
ජාතික වශයෙන් හඳුනාගෙන ඇති තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන්හී වර්තමාන ප්‍රගතිය පිළිබඳව පරිශිලකයින්ට අවබෝධයක් ලඟා කරගත හැකි අයුරින් ඉදිරිපත් කර ඇති අතර පළාත් මට්ටමින් ඉලක්ක හඳුනා ගැනීම සඳහා මෙම තොරතුරු ද අදාළ කර ගත හැකිවේ.

IV. SDG Budget Tagging & Coding Classification Table (https://sdc.gov.lk/en/resources)
සැලසුම් වල යෝජිත ක්‍රියාකාරකම් කුමන තිරසර සංවර්ධන අරමුණ සඳහා දායක වන්නේද යන්න හඳුනාගැනීම සඳහා සකස් කළ වර්ගීකරණ වගුව, ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සපයනු ඇත.

V. SDG Investor Map (https://sdginvestorplatform.undp.org/country/sri-lanka)
පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා පුළුල් කරමින්, තිරසර සංවර්ධන අරමුණු වලට වැඩි දායකත්වයක් සපයන, තිරසර බලශක්තිය, සෞඛ්‍ය, පාරිභෝගික භාණ්ඩ, ආහාර සහ පාන වර්ග, යටිතල පහසුකම් යන ක්ෂේත්‍ර 05 ක් ඔස්සේ හඳුනාගත් ආයෝජන අවස්ථා ඇතුළත් සිතියමක් සකස් කර ඇති අතර එමගින් ආයෝජන ක්ෂේත්‍ර හඳුනාගත හැකිය.

## ඇමුණුම 01 : පළාත්සභා සඳහා සුදුසු තිරසර සංවර්ධන දර්ශක සකස්කර ගැනීම.

තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය දර්ශක රාමුවේ සඳහන් දර්ශකයන් පදනම්කර ගනිමින්, පළාත්සභාවලට අනන්‍යවන දර්ශක රාමුවක් සකස්කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. ඒ අනුව සලකා බැලිය හැකි දර්ශකයන්ගෙන් කොටසක් පහත සඳහන් පරිදි ඉදිරිපත්කර ඇත.

| අරමුණු | දර්ශක |
|---|---|
| අරමුණු 01 | අන්තර්ජාතික දරිද්‍රතා රේඛාව |
| | ජාතික දරිද්‍රතා රේඛාව |
| | සමාජ ආරක්ෂණය |
| | මූලික පහසුකම් වලට ඇති ප්‍රවේශය |
| | ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව |
| | දුප්පතුන් සඳහා සම්පත් යෙදවීම |
| | දුප්පත්කම තුරන් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය |
| අරමුණු 02 | ඌන පෝෂණය හා ආහාර සුරක්ෂිතතාව |
| | මන්දපෝෂණය |
| | කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින් |
| | ආහාර අනාරක්ෂිතතා පරිමාණය |
| | කෘෂිකර්මාන්තය සඳහා ජාන සම්පත් |
| | කෘෂිකර්මාන්තය සඳහා ආයෝජන |
| | කෘෂිකාර්මික අපනයන සහනාධාර |
| | ආහාර මිල උච්චාවචනයන් |
| අරමුණු 03 | මාතෘ මරණ අනුපාතය |
| | ළමා මරණ  අනුපාතය |
| | බෝවන රෝග ව්‍යාප්තිය |
| | බෝනොවන රෝග හා මානසික සෞඛ්‍ය |
| | මත්ද්‍රව්‍ය භාවිතය |
| | නව යොවුන් කාන්තාවන් අතර නව යොවුන් අනුපාතය |
| | මාර්ග අනතුරු |
| | ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය |
| | විශ්වීය සෞඛ්‍ය ආවරණය |
| | පාරිසරික දූෂණ හේතුවෙන් වන සෞඛ්‍ය බලපෑම |
| | දුම්කොළ භාවිතය පාලනය |
| | සෞඛ්‍ය පර්යේෂණ |
| | සෞඛ්‍ය කාර්යමණ්ඩල හා මූල්‍ය ප්‍රතිපාදන |
| | සෞඛ්‍ය අවදානම් කළමනාකරණය |
| අරමුණු 04 | කාර්යක්ෂම ඉගෙනුම් ප්‍රතිඵල |
| | මුල් ළමාවිය සංවර්ධනය |
| | වෘත්තීය හා තෘතික අධ්‍යාපනය |
| | රැකියාවන් සඳහා කුසලතා |
| | අධ්‍යාපනය සඳහා සමානාත්මතා ප්‍රවේශය |
| | වැඩිහිටි සාක්ෂරතාවය |
| | තොරතුරු තාක්ෂණ කුසලතා අනුපාතය |
| | ප්‍රමාණාත්මක අධ්‍යාපන සංවර්ධනය |
| | අධ්‍යාපන පහසුකම් |
| | ශිෂ්‍යත්ව  සඳහා නිල සංවර්ධන ආධාර |
| | සුදුසුකම්ලත් ගුරුවරු සංඛ්‍යාව |
| අරමුණු 05 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට සිදුවන වෙනස්කම් |
| | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය |
| | අඩු වයස් විවාහ |
| | වැටුප් රහිත ගෘහාශ්‍රිත සේවා සැපයීම |
| | නායකත්වය තුළ කාන්තා නියෝජනය |
| | ප්‍රජනන සෞඛ්‍ය ප්‍රවේශය හා අයිතීන් |
| | සමාන ආර්ථික අයිතීන් |
| | කාන්තා සවිබල ගැන්වීම සඳහා තාක්‍ෂණය |
| | ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්ති |
| අරමුණු 06 | ආරක්‍ෂිත පානීය ජලය |
| | සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සඳහා ඇති ප්‍රවේශය |
| | ජලයේ ගුණාත්මකභාවය |

| | |
|---|---|
| | කාර්යක්ෂම ජල භාවිතය |
| | අන්තර් දේශ සීමා ජල සහයෝගීතා |
| | ජලය ආශ්‍රිත පරිසර පද්ධති |
| | ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ අන්තර්ජාතික සම්බන්ධතා |
| | සහභාගීත්ව කළමනාකරණය ( ජලය හා සනීපාරක්ෂක ) |
| අරමුණු 07 | බලශක්තිය සඳහා ප්‍රවේශය |
| | බලශක්ති බෙදීයාම |
| | බලශක්ති කාර්යක්ෂමතාව |
| | බලශක්තිය සඳහා අන්තර්ජාතික සම්බන්ධතා |
| | බලශක්ති යටිතල පහසුකම් සඳහා ආයෝජන |
| අරමුණු 08 | දළ ජාතික ආර්ථික වර්ධනය |
| | ආර්ථික ඵලදායිතාව හා නවෝත්පාදන |
| | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විධිමත් කිරීම |
| | අමුද්‍රව්‍ය සම්පත් කාර්යක්ෂමතාව |
| | රැකියාගත වීම හා සුනිසි රැකියා |
| | රැකියාවක, අධ්‍යාපන කටයුතු වල හෝ පුහුණුවක නිරත නොවන තරුණ ප්‍රජාව |
| | ළමා ශ්‍රමිකයන් |
| | කම්කරු අයිතීන් හා ආරක්ෂිත වැඩ පරිසරය |
| | තිරසර සංචාරක කර්මාන්තය |
| | මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය |
| | වෙළඳාම සඳහා ආධාර |
| | තරුණ රැකියා උපායමාර්ග |
| | මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය |
| අරමුණු 09 | යටිතල පහසුකම් සංවර්ධනය |
| | තිරසර සංයුක්ත කර්මාන්තකරණය |
| | මූල්‍යකරණයට කුඩා පරිමාණ කර්මාන්ත වලට ඇති ප්‍රවේශය |
| | අගය එකතු කිරීම් ඒකකයක් සඳහා විමෝචනය වන කාබන්ඩයොක්සයිඩ් වායු ප්‍රමාණය |
| | පර්යේෂණ හා සංවර්ධන |
| | ඔරොත්තුදීමේ හැකියාවෙන් යුතු යටිතල පහසුකම් |
| | ගෘහස්ත තාක්ෂණ සංවර්ධනය |
| | අන්තර්ජාල හා තොරතුරු තාක්ෂණය සඳහා ඇති ප්‍රවේශය |
| අරමුණු 10 | ආදායම් වර්ධනය |
| | අන්තර්කරණය (සමාජ, ආර්ථික,දේශපාලනික) |
| | වෙනස්කොට සැලකීම තුරන් කිරීම |
| | මූල්‍ය හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති |
| | මූල්‍ය වෙළඳපොල නියාමනයන් |
| | අන්තර්ගත වූ ගෝලීය පාලනයන් |
| | ආරක්ෂිත විගමනයන් හා සංචලන |
| | විශේෂ හා වෙනස් සැලකීම් |
| | සංවර්ධනය සඳහා සම්පත් යෙදවීම |
| | මූල්‍ය හා සමාජ ආරක්ෂණ ප්‍රතිශක්තීන් |
| | ප්‍රේෂණ වියදම් |
| අරමුණු 11 | නිවාස හා මූලික සේවා |
| | පොදු ප්‍රවාහන පද්ධතිය |
| | තිරසර නාගරීකරණය |
| | සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් |
| | ආපදාවන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව |
| | නාගරික වායුගෝලීය ගුණාත්මකභාවය හා කසළ කළමනාකරණය |
| | නාගරික හරිත හා පොදු අවකාශ |
| | නාගරික සැලසුම්කරණ |
| | ආපදා අවධානම් කළමනාකරණ ප්‍රතිපත්ති |
| | තිරසර හා ඔරොත්තු දීමේ හැකියාව සහිත ගොඩනැගිලි |
| අරමුණු 12 | තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය සඳහා වැඩසටහන් |
| | ස්වාභාවික සම්පත් වල තිරසර භාවිතය |
| | ආහාර අපද්‍රව්‍ය හා නාස්තිය |
| | රසායනික ද්‍රව්‍ය හා කසළ කළමනාකරණ |
| | අපද්‍රව්‍ය උත්පාදනය අඩුකිරීම |
| | තිරසර භාවිතාවන් සඳහා සහයෝගීතා |
| | තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන භාවිතාවන් |
| | තිරසර ජීවන රටාවන් පිළිබඳ දැනුවත්භාවය |
| | තිරසර සංවර්ධනය සඳහා පර්යේෂණ හා ධාරිතාවය සංවර්ධන දායකත්වය |

| | |
|---|---|
| | තිරසර සංචාරක කර්මාන්ත කටයුතු අධීක්ෂණය |
| | පොසිල ඉන්ධන සහනාධාර |
| අරමුණු 13 | ඔරොත්තු දෙන හා අනුවර්තනය වීමේ ධාරිතාව |
| | දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිපත්ති |
| | දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත්භාවය |
| | දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අදාල රාමුවට එකඟවීම (UNFCCC) |
| | දේශගුණික විපර්යාස අවම කිරීමට සැලසුම්කරණය හා කළමනාකරණය |
| අරමුණු 14 | සමුද්‍ර දූෂණය |
| | සාගර සහ වෙරළ ජෛව පරිසර පද්ධති |
| | සාගර ආම්ලිකකරණය |
| | තිරසර මත්ස්‍ය කර්මාන්තය |
| | වෙරළ ප්‍රදේශ සංරක්ෂණය |
| | ධිවර සහනාධාර |
| | කුඩා දිවයින් රාජ්‍ය වලට හා අවම සංවර්ධිත රටවල් සඳහා සමුද්‍රීය සම්පත් |
| | පර්යේෂණ ධාරිතා හා සාගර තාක්ෂණය |
| | කුඩා පරිමාණ පාරම්පරික මත්ස්‍ය කර්මාන්තය |
| | සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ක්‍රියාවට නැංවීම (UNCLOS) |
| අරමුණු 15 | ගොඩබිම හා මිරිදිය පරිසර පද්ධති |
| | තිරසර වනාන්තර කළමනාකරණය |
| | කාන්තාරිකරණය හා භූමි හායනය |
| | කඳුකර පරිසර පද්ධති සංරක්ෂණය |
| | ජෛව විවිධත්ව හායනය |
| | ජාන සම්පත් උපයෝගීතාවය |
| | සත්ත්ව හා ශාක විශේෂ මංකොල්ලය වැලැක්වීම |
| | ආක්‍රමණික ජීව විශේෂ තුරන් කිරීම |
| | ජාතික හා ප්‍රාදේශීය සැලසුම්කරණයට ජෛව විවිධත්වය ගොනු කිරීම |
| | ජෛව විවිධත්ව හා පරිසර පද්ධති සඳහා සම්පත් යෙදවීම |
| | වනාන්තර කළමනාකරණයට සම්පත් යෙදවීම |
| | ගෝලීය වශයෙන් සිදුවන සත්ත්ව හා ශාක විශේෂ මංකොල්ලය වැලැක්වීම |
| අරමුණු 16 | හිංසන හා ඒ ආශ්‍රිත මරණ අවම කිරීම |
| | මානව කුට්ටනය |
| | සැමට යුක්තිය |
| | නීතිවිරෝධී මුල්‍ය භාවිතය |
| | අල්ලස් හා දූෂණ වැළක්වීම |
| | කාර්යක්ෂම ආයතන |
| | අන්තර්කරණ වූ තීරණ ගැනීම |
| | අන්තර්කරණ වූ ගෝලීය පාලනය |
| | නිත්‍යානුකූල අනන්‍යතා |
| | තොරතුරු සඳහා මහජන ප්‍රවේශය |
| | හිංසනයන් වැලැක්වීම සඳහා ධාරිතා සංවර්ධනය |
| | වෙනස්කොට නොසැලකීමේ නීති |
| අරමුණු 17 | බදු හා සෙසු ආදායම් එකතු කිරීම් |
| | නිල සංවර්ධන ආධාර සඳහා වන එකඟතා |
| | අමතර මූල්‍ය සම්පත් |
| | ණය තිරසරකරණය |
| | ආයෝජන ප්‍රවර්ධනය |
| | විද්‍යාව හා තාක්ෂණික ජාත්‍යන්තර සහයෝගිතා |
| | තාක්ෂණික හුවමාරු |
| | තොරතුරු තාක්ෂණය සඳහා ධාරිතා සංවර්ධනය |
| | තිරසර සංවර්ධන අරමුණු සඳහා ධාරිතා සංවර්ධනය |
| | බහුපාර්ශවික වෙළඳ පද්ධති |
| | සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයන |
| | තීරුබදු රහිත වෙළඳපොල ප්‍රවේශය |
| | ගෝලීය සාර්ව ආර්ථික ස්ථායිතා |
| | තිරසර සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සුසංයෝගයන් |
| | රටෙහි ප්‍රතිපත්ති අවකාශයට ගරුකිරීම |
| | තිරසර සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගිතා |
| | හවුල්කාරිත්වයන් (රාජ්‍ය, පෞද්ගලික හා සිවිල් සංවිධාන) |
| | ජාතික දත්ත පද්ධති පැවතීම |
| | දත්ත ධාරිතා වර්ධනය |